**ජල සම්පත් මණ්ඩලය - 2023**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** තත්ත්වාගණනය කළ මතය

ජල සම්පත් මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පූර්ව වර්ෂ ගැලපුම් ලෙස දක්වා තිබූ රු.1,638,000 ක වටිනාකම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 හි 54 ඡේදය ප්‍රකාරව සිදුකළ යුතු හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් සකස් කිරීමෙන් පසු එම වර්ෂයේ ආදායමට ඇතුළත් විය යුතු ඉන්වොයිස් පත් 5 ක්, දුරකථන ගාස්තු වවුචරයක් හා බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බැකඩුව ඉඩම් සඳහා බදු මුදල් වෙන් කිරීමේදී වැඩිපුර වෙන්කර ඇති මුදලකින් සමන්විත වේ. 2024 වර්ෂයේදි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව නැවත ප්‍රකාශිත ශේෂ පිළිබඳ තොරතුරු හෙළිදරව් කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 49 ඡේදයට පටහැනිව දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේදි වත්කම් පන්තීන් 3 කට අයත් අයිතම 854 න් 150 ක් පමණක් රු. 80,754,510 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන තිබුණි. තවද ප්‍රත්‍යාගණිත වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 90 ඡේදය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව්කිරීම් කර නොතිබුණි. | ජල සම්පත් මණ්ඩලය සතුව පළාත් කාර්යාල 5ක් පවතින අතර මණ්ඩලය සතුව පවතින සියළුම වත්කම් එම එක් එක් අංශ සතුව පවති. අප මණ්ඩලයේ සේවක හිඟතාවය හේතුවෙන් යාපනය හා රත්මලාන පළාත් කාර්යාල තුළ පැවති වත්කම් ප්‍රත්‍යාගණනය කරවා ගැනීම සඳහා ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ සහයෝගය නොලැබීම මත එම දිස්ත්‍රික්ක දෙක සඳහා ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් සහභාගී නොවීම මත ප්‍රත්‍යාගණන කටයුතු සිදුකරවා ගැනීමට නොහැකිවීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වූ බව සඳහන් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව වත්කම් පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු අතර ඒ සම්බන්ධ හෙළිදරව් කිරීම්ද කල යුතුය. |
| (ඇ) | මණ්ඩලය විසින් 2016-2018 කාලය තුළ රු. 298,147,287 කට ප්‍රත්‍යාගණනය කර මේ වන විටත් භාවිතයට ගනිමින් පවතින වත්කම් පන්තීන් 4 කට අදාළ අයිතම 850 ක ඵලදායී ජීවිත කාලය අවසන් වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පොත් අගය ශූන්‍ය වී තිබුණු අතර එම වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ | කාර්ය මණ්ඩල හිඟතාවය හේතුවෙන් මෙම කාර්ය සිදුකළ නොහැකි වූ බව සඳහන් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ඵලදායී ජීව කාලය අවසන් වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමිති 7 හි 42 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10හි 14 ඡේදයට පටහැනිව රු.3,360,000ක් වූ විදුම් යන්ත්‍ර, විදුම් ආයතන හා භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කිරීමේ ආදායම මුදල් පදනමට ගිණුම් තබා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති 5 යටතේ ආදායම් හඳුනාගැනීම් යටතේ ආදායම උපචිත පදනම මත හඳුනාගන්නා බව හෙළිදරව් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ආදායම උපචිත පදනම මත හඳුනාගත යුතුය. |
| (ඉ) | භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ඇතුළු අනෙකුත් ව්‍යාපෘති හා වෙනත් හුවමාරු නොවන ලැබීම් වලින් ලද එකතුව රු. 1,797,835,000 ක ආදායම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 ප්‍රකාරව ගිණුම්ගත කර තිබුණ ද උක්ත අයභාර හඳුනා ගැනීම සඳහා යොදාගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11හි 107 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි. | මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 11 යටතේ හෙළිදරව් කර ඇත. | වත්කම් හඳුනාගෙන ගිණුම් තැබීමේ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුය. |
| (ඊ) | වාරිමාර්ග අමාත්‍යාංශය විසින් භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දින අවසන් කර මණ්ඩලයට භාර දී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | මේ යටතේ මිලදී ගත් ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලය වෙත ලබා දී තිබුණ ද රු.336,301,185 ක් වූ එම වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | ව්‍යාපෘතිය ඉදිරිපත් කල වත්කම්වල පිරිවැය පිළිගත නොහැකි තත්වයක පැවතුන අතර 2023 වර්ෂයේ ව්‍යාපෘති වත්කම්වල පිරිවැය නිවැරදිව අගය කිරීම සම්බන්ධව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද කමිටුව විසින් ලබාදුන් නිර්දේශයන්ට අනුකූලව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නිවැරදි වත්කම් අගයන් ඇතුළත් කර වාර්තාවක් ජල සම්පත් මණ්ඩලයට ඉදිරිපත් කළයුතු විය. එසේ වුවද 2024.02.28 දින වන විටත් එම වාර්තාව ඉදිරිපත් නොවීම මත එම වත්කම් පොත්වලට ගැනීමට නොහැකි වූ අතර 2024 වර්ෂයේ ගිණුම්වල මෙම වත්කම් ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 11 යටතේ හෙළිදරව් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ව්‍යාපෘති වත්කම් ගිණුම්ගත කිරීම හා ඒ හා සමාන අගයක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමටත් කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | රු.1,738,833,941 ක පිරිවැයකට මණ්ඩලයට පවරන ලද අධිතාක්ෂණික උපකරණ සහිත නළ ළිං 190 හා ඒවායේ නඩත්තු උපකරණ සහ රු.1,534,077,024 ක වටිනාකමකට මණ්ඩලයට පවරන ලද පරිභෝජන භාණ්ඩවල වටිනාකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 83 ඡේදය ප්‍රකාරව අගයකර ගිණුම්ගත කර නොතිබුණි. | ව්‍යාපෘතිය ඉදිරිපත් කල වත්කම්වල පිරිවැය පිළිගත නොහැකි තත්වයක පැවතුන අතර 2023 වර්ෂයේ ව්‍යාපෘති වත්කම්වල පිරිවැය නිවැරදිව අගය කිරීම සම්බන්ධව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද කමිටුව විසින් ලබාදුන් නිර්දේශයන්ට අනුකූලව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නිවැරදි වත්කම් අගයන් ඇතුළත් කර වාර්තාවක් ජල සම්පත් මණ්ඩලයට ඉදිරිපත් කළයුතු විය එසේ වූවද 2024.02.28 දින වන විටත් එම වාර්තාව ඉදිරිපත් නොවීම මත එම වත්කම් පොත්වලට ගැනීමට නොහැකි වී ඇති අතර 2024 වර්ෂයේ ගිණුම්වල මෙම වත්කම් ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.මේ සම්බන්ධව මුල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 11 යටතේ හෙළිදරව් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ව්‍යාපෘති වත්කම් ගිණුම්ගත කිරීම හා ඒ හා සමාන අගයක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමටත් කටයුතු කල යුතුය. |
| (iii) | ව්‍යාපෘතිය විසින් ඩබල් කැබ් රථ 2ක් මිලදී ගෙන ජංගම රසායනාගාර බවට පරිවර්තනය කර 2023 පෙබරවාරි 15 දින මණ්ඩලයට භාර දී තිබූ අතර ඒවායේ වටිනාකම රු.33,541,773 ක් ලෙස යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 57 ඡේදය ප්‍රකාරව මෙම රථ 2 හි වටිනාකම මෝටර් වාහන ලෙස හා එහි සවිකල උපකරණ රසායනාගාර උපකරණ ලෙස ගිණුම්ගත කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.ඉන්වොයිසි වටිනාකම අනුව මෝටර් රථ 2 හි පිරිවැය වූ රු.21,700,000 මත සියයට 25 බැගින් රු.4,746,875ක් ක්ෂය කළ යුතු වුවත් යන්ත්‍රෝපකරණ ලෙස සලකා සියයට 20 බැගින් රු.3,352,340 ක් ක්ෂය කර තිබීම හේතුවෙන් ක්ෂය රු.1,394,535ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. – 2024 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව නිවැරදි ක්ෂය වෙන් කිරීම කල යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2හි 56 ඡේදය ප්‍රකාරව මුදල් හා මුදල් සමාන දෑ වල සංරචක සියල්ල හෙළිදරව්කළ යුතු වුවද ලංකා බැංකුවේ අංක 0002323267 දරන ජංගම ගිණුම සම්බන්ධිතව පවත්වාගෙන ගොස් තිබූ අරමුදල් කළමනාකරණ ඉතිරි කිරීමේ ගිණුමේ පැවති රු.61,200,069 ක ශේෂය වෙන්ව දැක්වීම වෙනුවට අදාළ ජංගම ගිණුමේ ශේෂය සමඟ එකට ගෙන දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් අංක 0002323267 යටතේ දක්වා ඇති ශේෂය තුළ මෙම අරමුදල් ගිණුම් ශේෂයද ඇතුළත් වේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව මුදල් හි මුදල් සමාන දෑ වල සංරචක හෙළිදරව් කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 ඔක්තෝබර් 30 දින රු. 61,062,600 කට ප්‍රත්‍යාගණනය කර තිබූ රසායනාගාර උපකරණ අයිතම 80 ක වටිනාකම රු.5,465,000 ක් වශයෙන් රු.55,597,307 ක් අඩුවෙන් දක්වා තිබුණි. එම හේතුවෙන් එකී වත්කම් සඳහා වූ ක්ෂය වියදම රු.963,393 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ජල සම්පත් මණ්ඩලයේ වත්කම් කළමනාකරණ මෘදුකාංගයේ දෝෂයක් මත මෙම විද්‍යාගාර උපකරණවල ප්‍රත්‍යාගනිත අගය වෙනස් වී ඇත. | ප්‍රත්‍යාගණිත වත්කම් හා නිවැරදිව ක්ෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කල යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළ නියෝග. | | | |
| (i) | 02 නියෝගය | නළ ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි වියයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 42 ක් පමණක් ලියාපදිංචි වී තිබුණි.ඉකුත් වර්ෂයේ ආයතන 72 ක් ලියාපදිංචි වී තිබුණු අතර ලියාපදිංචි වී නොමැති හා ලියාපදිංචිය අළුත් නොකළ ආයතන නළ ළිං ඉදිකිරීම් නොකරන බව තහවුරු කර ගැනීමට හා මණ්ඩලයේ ලියාපදිංචි වී නොමැති ආයතන මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් මණ්ඩලය සතුව නොතිබුණි. තවද ඉහත නියෝගය පරිදි ලියාපදිංචි ආයතන විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියළු නළ ළිංවල | නල ළිං ඉදිකරනු ලබන ආයතන ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු සකස් කරමින් පවතී.මෙහිදී පුවත්පත් දැන්වීම් පල කර ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. තවද ජල සම්පත් මණ්ඩල පනතෙහි නල ළිං ඉදිකරනු ලබන ආයතන ලියාපදිංචි නොවීම සම්බන්ධයෙන් ගත හැකි නීතිමය ප්‍රතිපාදන නොමැති බැවින් අදාල පනත සංශෝධනය කරනු ලැබූ අතර අවශ්‍ය අනුමැතීන් සඳහා යොමු කර ඇත. දැනට | නළ ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන හඳුනා ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දත්තයන් ඇතුලත් වාර්තාවක් සෑම මාස 03 කට වරක් මණ්ඩලය වෙත ලබා දිය යුතු වුවත් ලියාපදිංචි ආයතන 42 අතරින් උක්ත වාර්තාව ලබා දී තිබුණේ ආයතන 4 ක් පමණකි. | ලියාපදිංචි සියළු නල ළිං විදුම් ආයතන දැනුවත් කර නැවත ජල සම්පත් මණ්ඩලයෙහි ලියාපදිංචිය යාවත්කාලීන කරන මෙන් ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන ලදී. | |
| (ii) | 03 නියෝගය | ජලය බෝතල්කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන ආයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් සෑම මාස 6 කට වරක්ම එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂා කරවාගෙන අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආයතන 42 න් උක්ත වාර්තා මණ්ඩලය වෙත ලබා දී තිබුණේ ආයතන 9 ක් පමණකි. | අදාල රසායණික වාර්තා ජල සම්පත් මණ්ඩලය වෙත ලබා දෙන ලෙස අදාල ආයතන වෙත ලිඛිතව දැනුම් දීම් සිදු කරන ලදී. ඒ අනුව මේ වන විට රසායණික වාර්තා ජල සම්පත් මණ්ඩලය වෙත ලැබෙමින් පවතී. තවද, අනෙකුත් රජ්‍ය ආයතන හා සම්බන්ධ වී මෙම වාර්තා ලබා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා ගෙන මෙම කටයුත්ත තවදුරටත් විදිමත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජල නිෂ්පාදන ආයතන විසින් ජල නියැදියන් පරික්ෂාකර වාර්තා ඉදිරිපත් කල යුතුය. |
| (iv) | 06 නියෝගය | ස්වභාවික ජල උල්පත් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන විසින් අනුගමනය කළ යුතු නියමයන් ඇතුළත් 1 සිට 5 දක්වා නියෝග ප්‍රකාරව කටයුතු නොකරන ආයතන, සංවිධාන හෝ පුද්ගලයන්ට එරෙහිව 1999 අංක 42 දරන පනතින් සංශෝධිත 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | භූගත ජලයේ ගුණාත්මකභාවයට අදාල වාර්තා ලබා නොදෙන ආයතන හා විදුම් වාර්තා ලබා නොදෙන ආයතන සඳහා අවශ්‍ය නීතිමය පියවර පවත්නා පනතට අනුව සිදු කිරීමට කටයුතු යොදා ඇත. තවද, අනෙකුත් රජ්‍ය ආයතන හා සම්බන්ධ වී මෙම වාර්තා ලබා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා ගෙන මෙම කටයුත්ත තවදුරටත් විදිමත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | ස්වභාවික ජල උල්පත් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිතා කරන ආයතන වලට අදාල නියෝග අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 10 හා 11 වගන්ති | අරමුදල සඳහා සේවා දායකත්වය සියයට 12 ක් හා සේවක දායකත්වය සියයට 8 ක් විය යුතු අතර ඊට වැඩි අනුපාතයකට එකඟ විය හැක. එසේ වුවද, මණ්ඩලයේ | අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා සටහන් කර ගතිමු. | පනතේ සඳහන් අනුපාතයන්ට වැඩි අනුපාතයක් අයකිරීම |

| | | | | |
|---|---|---|---|---|
| | | සේවා දායකත්වය සියයට 12ක් වීමේදී සේවකයන්ගෙන් සියයට 10 ක් අයකර ගෙවා තිබුණද ඒ සම්බන්ධයෙන් කොමසාරිස්වරයා වෙත දැනුම් දී නොතිබුණි. | | සම්බන්ධව කොමසාරිස්වරයා දැනුවත් කල යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) | මාර්ගෝපදේශ 2.2.1 | මණ්ඩලය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක නිශ්චය කර හෝ සංයුක්ත සැලැස්මක් සකස් කර හෝ ඒ අනුව මණ්ඩලය මෙහෙයවීමට කටයුතු කර නොතිබුණි. | ජල සම්පත් මණ්ඩලය සඳහා කාර්යය දර්ශණ සහ සංයුක්ත සැළසුම් සකස්කර තිබුණද මෑතක සිට ජාතික ජල ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ජාතික ජල ලේකම් කාර්යාලය පිහිටුවීමද ඒ සමඟ ජල සම්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහ ගත කිරීමේ කාර්යය සඳහා මෙම කටයුතු තාවකාලිකව නවතා දමනු ලැබිණි. | කාර්යසාධන දර්ශක හා සංයුක්ත සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | මාර්ගෝපදේශ 2.2.2 (ආ) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කියවා අධ්‍යනය කිරීම සඳහා මණ්ඩල සාමාජිකයින් වෙත ඉදිරිපත් කිරීම, තීරණ ගැනීමට හා වගවීම තහවුරු කිරීමට අවශ්‍ය මනා විශ්වාසදායී කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගැනීම, විගණන කමිටු ඇතුළු අනෙකුත් උප කමිටුවල තීරණ කාලීනව පසු විපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා සම්බන්ධිත පාර්ශවයන්ගේ අවශ්‍යතා ඉටුවන, මූල්‍ය හා මූල්‍ය නොවන උපරිම තොරතුරු පරිශීලන හිතකාමී පරිදි ආයතනයේ වෙබ් පිටුව මගින් හෙළිදරව් කිරීම යන අවශ්‍යතා | සටහන්කර ගතිමි. | මාර්ගෝපදේශ වලට අනුකූලව ශක්තිමත් පාලන රාමුවක් ස්ථාපිත කිරීමට හා මෙහෙයවීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉටුවන පරිදි ශක්තිමත් පාලන රාමුවක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | | |
| (iii) | මාර්ගෝපදේශ 2.4 | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලය සමඟ වූ සම්බන්ධතා පිළිබඳ මණ්ඩලයේ ලේකම් වෙත වාර්ෂික ප්‍රකාශයක් සිදුකර නොතිබුණු අතර මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ එක් එක් අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් අදාළ හෙළිදරව් කිරීම්ද සිදු කර නොතිබුණි. | මණ්ඩලයේ ලේකම් තනතුරක් නොමැති අතර දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සටහන් කර ගනිමි. | වාර්ෂික ප්‍රකාශයක් ලබා ගැනීමට හා අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ දැක්වීම කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2023 වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | දැනට 2023 වාර්ෂික වාර්තාව දැනට සකස් කෙරෙමින් පවතින අතර 2024 අවසන් ගිණුම් සමඟ කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් කිරීමට සටහන් කර ගනිමි. | කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,383,454,000 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.27,506,000ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,410,960,000 ක ශුද්ධ වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂයේ වියදමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු.7,254,000 කින් හා ජලජ පරීක්ෂක හා ගවේෂණ ආදායම රු.18,008,000 කින් වැඩි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරීමේ නියමු ව්‍යාපෘතියේ කාර්යයක් ලෙස ජංගම රසායනාගාර 2 ක් ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.21,700,000 කට ඩබල්කැබ් 2 ක් මිලදී ගෙන ව්‍යාපෘති අධ්‍යක්ෂ නමින් ලියාපදිංචි කර පුද්ගලික ආයතනයකට | වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ Turnkey EPC (Engineering, Procurement & Construction) ව්‍යාපෘතියක් ලෙස ජල සම්පත් මණ්ඩලය සඳහා භූ ගත ජල විමංසන පද්ධතින් රටෙහි තෝරාගත් කලාප කිහිපයක ස්ථාපනයට නෙදර්ලන්ත කොන්ත්‍රාත්තු සමාගමක් වන Eijelkamp | ජංගම රසායනාගාර ඉදිකිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාර දී ජංගම රසායනාගාර බවට පත්කර තිබුණු අතර ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ආයතනයක් තෝරා ගෙන නොතිබුණි. | ආයතනය හරහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.මෙම ව්‍යාපෘතියෙහි ගිවිසුම් ගත ක්‍රමවේදය අනුව ජල සම්පත් මණ්ඩලයේ මූලික තාක්ෂණික අවශ්‍යතා පදනම්ව කොන්ත්‍රාත්තු සමාගම විසින් ප්‍රසම්පාදන කටයුතු කෙරුණද මණ්ඩලයට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වීමේ අවකාශයක් නොතිබුණි. | |
| (i) | අදාළ රථ 2 ජංගම රසායනාගාර බවට පත්කර 2023 පෙබරවාරි 15 දින මණ්ඩලය වෙත භාරදී තිබුණු අතර පරිවර්තන කටයුතු සඳහා රු.11,841,774 ක් පුද්ගලික සමාගම විසින් අයකර තිබුණි. එසේ වුවද එම වාහන දෙකෙන් ඉවත් කර ඇති පසුපස කොටස් (Rear Tube Tail Body) දෙක මණ්ඩලය වෙත ආපසු භාර දී නොතිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකර ඊට වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි. | මෙම ජංගම රසානාගාර රථ දෙක සඳහා අනුමැතිය ලබා ගැනීමට කැබිනට් මණ්ඩලය මගින් පත් කරනු ලැබූ ව්‍යාපෘති ඇගයුම් කමිටුව වෙත යොමු කෙරෙනුයේ අභිරුචිකරණය කරනු ලැබූ නිමවුම් ඒකකයන් (Customized Double Cabs as Mobile Field Test Units) ලෙසය. ඒ අනුව කොන්ත්‍රාත්තු සමාගම විසින් මෙහි ප්‍රසම්පාදනයන් සහ ඉල්ලුම් කරනු ලැබූ තාක්ෂණික පිරිවිතරයන් මත සැකසීම සිදු කරනු ලැබිණ. එහිදී ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් මිලදී ගනු ලැබූ ඩබල් කැබ් රථ දෙක සෘජුවම අදාල අභිරුචිකරණය කරනු ලබන ආයතනය වෙත ලබාදී එම කටයුතු සියල්ල නිම වූ පසු ව්‍යාපෘති අධ්‍යක්‍ෂක විසින් නිමවුම් ඒකක ලෙස මෙම ජංගම රසායනාගාර රථ දෙක ව්‍යාපෘතියට 2022.09.15 දින ලිඛිතව බාර දී ඇත. | මුදල් රෙගුලාසි අනුව පරීක්ෂණ සිදුකර වගකිව යුත්තන් නිශ්චය කර ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | ජංගම රසායනාගාර රථ 2, 2023 මැයි 02 දින මණ්ඩලයේ සභාපති නමින් කැබ් රථ ලෙස ලියාපදිංචි කර තිබුණද ජංගම රසායනාගාර ලෙස ලියාපදිංචිය සංශෝධනය කර නොතිබුණි. | මෙම රසායනාගාර ජංගම රථ දෙක ව්‍යාපෘති අධ්‍යක්‍ෂක යටතේ ලියාපදිංචි වී නැවත මණ්ඩලය වෙතට පවර ගැනුන අතර මෝටර් රථ දෙපාර්තුමෙන්තුවෙහි මෙම රථ දෙක රසායනාගාර රථ දෙකක් ලෙස ලියාපදිංචි නොවී ඇති බැවින් එය වෙනස් කිරීම සඳහා ඇති හැකියාව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය. | අදාළ කැබ් රථ දෙක ජංගම රසායනාගාර ලෙස ලියාපදිංචි කල යුතුය. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත්, බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 40 කින් යුත් ඉඩමක් 2016 දෙසැම්බර් 06 දිනැති අංක අමප/16/2500/724/099 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් වර්ෂ 30 ක කාල සීමාවක් සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදීමට තීරණය කර තිබුණි. නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත, එකී ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරු කරු විසින් වාර්ෂිකව රු.2,700,000 ක බදු මුදලක් | අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි මණ්ඩලය පරිහරණය කරනු ලැබූ හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ අංක 2 ඒ දරණ ස්ථානයේ පිහිටි ඉඩම වෙනුවට ලබා දෙන ලද බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩමේ භුක්තිය 2016.10.10 දින ජල සම්පත් මණ්ඩලයට භාරදෙන ලදී. භූගත ජල විමංශන ජාල ව්‍යාපෘතිය මගින් ඉදිකිරීමට නියමිතව තිබූ දත්ත මධ්‍යස්ථානය සහ ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සමඟ රසායනාගාරය මෙම ඉඩමේ ස්ථාපණය කිරීමට සැළසුම් | විධිමත් අනුමැතියක් මත හිඟ මුදල කපා හැරිය යුතු අතර නාගරික සංවර්ධන අධිකාරිය සමඟ බදු ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය එකඟතාවය ලබා ගැනීම කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තීරණය කර තිබුණි.ඉඩම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමග බදු ගිවිසුමකට අත්සන් කිරීමකින් තොරව මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් දක්වා කුලිය වශයෙන් රු.24,906,879 ක් එම අධිකාරියට ගෙවා තිබුණද ඉඩම භාවිත කර නොතිබුණි.එමෙන්ම භූ ගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතිය යටතේ මෙම ඉඩමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ සිට ප්‍රතිපාදන වෙන්වී තිබුණද විධිමත් බදු ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.එමෙන්ම රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය යටතේ කොළඹ 7 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම සඳහා ගෙවීමට ඇති රු. 56,409,666,000 ක හිඟ බදු මුදල ගෙවීමෙන් හෝ නිසි ක්‍රමවේදයක් යටත් කපා හැරීම සිදු කරන තෙක් ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි මෙම ඉඩම සඳහා දීර්ඝ කාලීන බදු ගිවිසුමකට එළඹීම නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රතික්ෂේප කර තිබුණි. | කර අවශ්‍ය අනුමැතීන් පවා ලබා ගෙන තිබූ අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉඩමට ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද කිරීම නිසා ව්‍යාපෘති කාලය අවසන්වීමත් සමඟ එම අවස්ථාව මග හැරුණි. බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් වෙත ගෙවිය යුතුව තිබූ හිඟ මුදල වූ රු.56,409,666.00 ගෙවීමෙන් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් කපා හැරීමෙන් පසු ගිවිසුම අත්සන් කරන බව නාගරික සංවර්ධන අධිකාරිය දන්වා සිටීම සැලකිල්ලට ගෙන ජල සම්පත් මණ්ඩලය දැනටමත් මෙම හිඟ මුදල කපා හැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා සංදේශයක් ඉදිරිපත් කර ඇත. | |
| (ඇ) | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි විධිවිධාන පරිදි මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ JM-1 වැටුප් කාණ්ඩයට අයත්ව තිබූ ඇතැම් තනතුරු ප්‍රතිව්‍යුහගතකරණයේදී MM කාණ්ඩයේ (මධ්‍යම කළමනාකරණ මට්ටම) තනතුරු බවට පරිවර්තනය කර තිබුණි. 2012.10.03 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු එම තනතුරු වලට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් 5 දෙනෙකු හට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2010 හා 01/2013 හා 01/2018 යටතේ සහනදායි පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර කාලසීමාවද MM කාණ්ඩයේ තනතුරු දැරූ ලෙස සලකා සාවද්‍ය ලෙස සේවා කාලය | මෙම නිලධාරීන් සම්බන්ධව ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් මූලික විමර්ශණයක් සිදුකර වාර්තාවක් ලබා දී ඇති අතර, ඒ අනුව අදාල නිලධාරීන්ට චෝදනා පත්‍ර නිකුත් කර ඇත.මේ සම්බන්ධව ජල සම්පත් මණ්ඩලය විසින් විධිමත් විනය පරීක්ෂණයක් සිදු කෙරෙමින් පවතින අතර, එම කටයුතු දැනට අවසන් වෙමින් පවතින අතර මැයි මසය අවසන් වන විට එම වාර්තාව ලබා දෙන බව පරීක්ෂණ නිලධාරීන් දැනුම් දී ඇත. | පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගණනය කර උක්ත මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීමට නිර්දේශ කර තිබුණි.පළමු සහනදායී වාහන ආනයන බලපත්‍ර ලබාගත් මෙම නිලධාරීන්ගෙන් නිලධාරීන් තිදෙනෙකුට 2018 වර්ෂයේ නැවත දෙවන බලපත්‍රය ලබා ගැනීමටද අවශ්‍ය නිර්දේශ ලබා දී තිබුණි. බලපත්‍ර ලබාගෙන වසර 10 ක කාලයක් ගත වී තිබුණද එම නිලධාරීන් සඳහා ආරම්භ කර තිබූ විනය පරීක්ෂණය මේ දක්වා අවසන් කර නොතිබුණි. ඒ සම්බන්ධ අදාල නිර්දේශ ලබා දුන් නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට මණ්ඩලය විසින් මේ දක්වා පියවර ගෙන නොතිබුණි. | | |
| | මීට අමතරව මේ වන විට විශ්‍රාම ලබා ඇති නිලධාරී 5 දෙනෙකු සඳහාද නියමිත සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර සහනදායී වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට නිර්දේශ ලබා දී එම නිලධාරීන් බලපත්‍ර ලබා ගෙන තිබුනු අතර ඒ අනුව එම නිලධාරීන් බලපත්‍ර ලබා ගැනීම තුළින් සිදුකර ඇති අලාභ අයකර ගැනීමටත් එම බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදුන් නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමටත් පියවර ගෙන නොතිබුණු අතර නිලධාරීන් විශ්‍රාම ගැනිමේදී රජයට අයවිය යුතු මෙම අලාභ අයකර නොගෙන පාරිතෝශිත ගෙවා තිබුණි. | සහනදායි පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර ලබා ගෙන තිබියදී විශ්‍රාම ගොස් සිටින නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සහ අමාත්‍ය ලේකම් වරයා දැනුවත් කර අවශ්‍ය උපදෙස් මත පියවර ගැනීමට සටහන් කර ගතිමි. | බලපත්‍ර ලබා දීම නිර්දේශ කල නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට කටයුතු කල යුතු අතර බලපත්‍ර ලබා දීම තුලින් සිදුවූ අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පත පිළියල කිරීම සඳහා පෞද්ගලික නීතිඥයෙකු හා නීතිඥ සමාගමක සේවය ලබා ගෙන විගණිත දිනය වන විට රු.645,000ක් ගෙවා තිබුණු අතර පනත සංශෝධනය කළ යුතු බව හඳුනා ගෙන වසර 4 ක් ගත වී තිබුණද එම කාර්යය ඉටුකර නොතිබුණි. | යෝජිත ජාතික ජල ප්‍රතිපත්තිය ප්‍රකාශ කිරීම සහ ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය පිහිටුවීම ද ඒ හරහා ජල සම්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහ ගත කිරීම යන කරුණු හේතුකොට ගෙන ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනයකිරීම ඇණහිට ඇත. | ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ඉ) | 2016 වර්ෂයේදී අවුරුදු 30 ක කාලසීමාවක් සඳහා කුලී පදනම මත මණ්ඩලයට පවරා තිබූ අනුරාධපුර සංචාරක බංගලාව ඉදිකර ඇති ඉඩම සඳහා වසර 7 ක් ඉක්මවා තිබුණද කුලී | අනුරාධපුර සංචාරක නිවස පිහිටි ඉඩම සම්බන්ධයෙන් බදු ගෙවීම සඳහා ඉඩම මැනුම් කරවා ගැනීමට ප්‍රාදේශීය ලේකම් හරහා බලය ලත් මිනින්දෝරුවරයෙකු සම්බන්ධ කරගෙන ඉදිරි කටයුතු සිදු කලද | වැව රක්ෂිතය තුළ පිහිටි ඉඩමක් සඳහා කුලී ගිවිසුමකට එළඹීමට හැකියාව විමසා බලා ඒ අනුව |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මෙම ඉඩම සඳහා කිසිදු කුලියක් ගෙවීමට මේ දක්වා කටයුතු කර නොමැත. | මෙම ඉඩම වැව රක්ෂිතය තුල පිහිටා ඇති බැවින් ගැටළුව නිරාකරණය කර ගැනීමට අපහසු වී ඇත. | කටයුතු කල යුතුය. |
| (ඊ) | මණ්ඩලය විසින් 2018 වර්ෂයේ සිට භූ ජල විද්‍යාඥයින් ලියාපදිංචි කර ඔවුන් වෙත පෞද්ගලිකව වෘත්තීමය සේවාවන් සැපයීමට අවසරය ලබා දී තිබුණි. 1964 අංක 29 අංක දරණ ජල සම්පත් මණ්ඩල පනත යටතේ ඒ සඳහා නෛතික ප්‍රතිපාදන ලැබී නොතිබුණ අතර භූ ජල විද්‍යාඥයින් 12ත් 18ත් අතර සංඛ්‍යාවක් වාර්ෂිකව ලියාපදිංචි කර තිබුණි. | නල ළිං ඉදිකිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය මගින් අනුමැතිය ලබා දිය යුතු බැවින් එම අනුමැතිය සඳහා අදාල ස්ථානයේ භූජල සමීක්ෂණයක් සිදු කර වාර්තාවන් මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා පමණක් බාහිර භූජල විද්‍යාඥයින් ලියාපදිංචිය සිදුකර තිබුණි. මෙම කටයුතු විධිමත්ව සිදු කිරීම සඳහා ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනයේදී අදාල කරුණු ඇතුළත්ව අවශ්‍ය අනුමැතිය සඳහා ඉදිරිපත් කරඇති අතර අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් පරිදි මේ සඳහා වන ඉදිරි වැඩකටයුතු සිදුකරමින් පවතී. | අදාළ විධිවිධාන ඇතුළත්ව ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ භූගත ජලයේ පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් කළමනාකරණය කිරිම සඳහා පද්ධතියක් ස්ථාපනය කිරීමට, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල විමංසන ජාලයක් ස්ථාපිත කිරිමේ නියමු ව්‍යාපෘතිය වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය,පොළොන්නරුව,මොණරාගල සහ පුත්තලම ලෙස තෝරා ගත් දිස්ත්‍රික්ක 4 ක ක්‍රියාත්මක කිරිම සඳහා 2015 ජූලි 29 දිනැති අංක අමප/15/1087/644/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි.එකී ව්‍යාපෘතිය යුරෝ 20,629,921ක පිරිවැයකට ක්‍රියාත්මක කිරිම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් නෙදර්ලන්තයේ රෝයල් අයිකල්කැම්ප් ආයතනය සමඟ 2017 ඔක්තෝබර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු 2022 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පිරිවැය වූ යුරෝ 20,629,921.18 හෙවත් රුපියල් 5,521,329,000 න් සියයට 85 ක් එනම් යුරෝ 17,535,433 ක් නෙදර්ලන්තයේ | | |

| | | | |
|---|---|---|---|
| | රේබෝ බැංකුවෙන් (Rabo Bank) වාර්ෂිකව සියයට 1.45 බැගින් වූ සහන පොලී අනුපාතයක් මත වර්ෂ 10ක් තුළ සමාන වාරික 20 කින් ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි. ඉතිරි සියයට 15 වන යුරෝ 3,094,488.18 ක මුදල ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව වෙතින්, වසර 3 ක සහන කාලයකින් පසු 2025 දෙවන අර්ධ වර්ෂයේ සිට වසර 15 කින් ගෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා ගෙන තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | ව්‍යාපෘතිය 2022 වර්ෂයේ නිම කර තිබුණද එහි මූලික අවශ්‍යතාවයක් වූ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි නොකිරීම නිසා ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ නිසිලෙස ලබාගත නොහැකි වී තිබුණි. | දත්ත මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා සැලසුම් කෙරුනද නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිසි බදු ගිවිසුමක් 2022 ජූලි මස වන විටත් ලබා නොදීම හේතුවෙන් ව්‍යාපෘතිය නිමවීමට ආසන්න (2022 දෙසැම්බර්) වනතුරු ඉදි කිරීම් ආරම්භ කල නොහැකි විය.රත්මලාන වැඩබිම් කාර්යාලයෙහි (Workshop) සියලු අවශ්‍ය විශේෂාංග සහිතව දත්ත මධ්‍යස්ථානය ව්‍යාපෘති අරමුණු සහ අවශ්‍යතාවයන් අනුව මේ වන විට ස්ථාපනය කර කටයුතු කරගෙන යනු ලබයි. | ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | බත්තරමුල්ල නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 259.1 ක් හෙවත් යුරෝ 1,473,462 ක් වෙන්කර තිබුණු අතර රු. මිලියන 329.8 ක් හෙවත් යුරෝ 1,875,447 ක අවිනිශ්චිත වෙන් කිරීම්ද දත්ත මධ්‍යස්ථානය සඳහා භාවිතා කිරීමට තීරණය කර තිබුණි. මෙකී මුළු වටිනාකමින් සියයට 15 ක් වූ රු.මිලියන 544.2 ක් හෙවත් යුරෝ 3,094,488 ක් අත්තිකාරම් ලෙස නෙදර්ලන්ත කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු නමුත් ඉඩම් හිමිකාරීත්වය ලැබී නොතිබීම හේතුවෙන් දත්ත මධ්‍යස්ථානය ඉදි කර නොතිබුණු අතර ගෙවා තිබූ යුරෝ 3,094,488 ක අත්තිකාරම් මුදල නිශ්කාර්ය වී තිබුණි. | මෙහිදී දත්ත මධ්‍යස්ථානය ජල සම්පත් මණ්ඩලයේ පවතින ගොඩනැගිල්ලක් තුල ස්ථාපිත කිරීම හේතුවෙන් ඇති වුනු ව්‍යාපෘති ඉතුරුම් පිළිබඳව ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තුමේන්තුව වෙත සහ අධ්‍යක්ෂ (විදේශ ණය -1)- භාණ්ඩාගාර දෙපාර්තුමේන්තුව, ප්‍රධාන ගණකාධිකාරී- වාරිමාර්ග අමාත්‍යාංශය වෙතද පිටපත් සහිතව දැනුම් දී ඇති ඇත. ඒ අනුව මෙම ශේෂය පදනම්ව ණය වාරිකයන් ගෙවීමේදී එම අඩුකිරීම්ද ඇතුලත්ව ණය ගෙවීම් සිදු කරන බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් දන්වන ලදී. | අත්තිකාරම් නොපමාව අයකරගත යුතු අතර වගකිවයුතු මණ්ඩලයේ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (ආ) | මණ්ඩලයේ විදුලි අංශයට විදුලි කළමණාකරුවකු, විදුලි නිළධාරීන් 11 | විදුලි අංශය සතු විදුලි යන්ත්‍ර 18 න් 3 ක් 2023 වර්ෂයේදී වෙන්දේසි කරන ලදී. | විදුලි අංශයේ කටයුතු සමාලෝචනය කර |

| | | | |
|---|---|---|---|
| | දෙනෙකු ඇතුලු 52 දෙනෙකුගෙන් යුත් සහාය කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණු අතර එම කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, අතිකාල, ගමන් වියදම් හා අනෙකුත් පිරිවැය වශයෙන් රු.65,965,000 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි. එම අංශය සතුව පැවති විදුම් යන්ත්‍ර 18 න් 9ක් පමණක් ක්‍රියාකාරි තත්වයේ පැවති අතර ඉන් ව්‍යාපෘතියෙන් ලැබුණු නවීන විදුම් යන්ත්‍ර 2 සඳහා නඩත්තු හා සේවා වියදම් හා අලුත්වැඩියා වියදම් අධික වීම හේතුවෙන් සේවයේ යොදවා නොතිබුණි. ඉතිරි විදුම් යන්ත්‍ර 07 න් සමාලෝචිත වර්ෂයේ නළ ළිං 58 ක් පමණක් ඉදිකර තිබුණු අතර ඒ අනුව ක්‍රියාකාරී තත්වයේ පැවති එක් යන්ත්‍රයකින් නළ ළිං 8 ක් පමණක් ඉදිකර තිබුණි. එක් යන්ත්‍රයක් සඳහා විදුම් නිලධාරියකු හා 8 දෙනෙකුගෙන් යුත් සහය කාර්ය මණ්ඩලයක් අනුයුත්ත කර තිබූ අතර එම එක් කණ්ඩායමක් විසින් මාස දෙකකට එක් නළ ළිදක් පමණක් ඉදිකර තිබුණි. | ඉතිරි 15න් 06 ක් පැරණි විදුම් යන්ත්‍ර වන අතර ඉන් 02 ක් නෙදර්ලන්ත ව්‍යාපෘතිය මඟින් ලැබුණු නවීන විදුම් යන්ත්‍ර වේ.ඒවා පවත්වාගෙන යාමේදී නඩත්තු,සේවා හා අලුත්වැඩියා වියදම් අධික වීම නිසා ඉතිරි විදුම් යන්ත්‍ර 07 න් පමණක් 2023 වර්ෂයේදී නල ළිං විදුම් කරන ලදී. නෙදර්ලන්ත ව්‍යාපෘතිය හරහා ලැබුණු නවීන විදුම් යන්ත්‍ර 02 IWWRMP ව්‍යාපෘතියේ පරීක්ෂණ නලළිං ඉදි කිරිම සඳහා යෙදවීමට නියමිතය. | මානව සම්පත කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |
| (i) | 2018 වර්ෂය සිට මණ්ඩලයේ විදුම් අංශය වෙත ලැබු ඇණවුම් ප්‍රමාණය 280 සිට 58 දක්වා වාර්ෂිකව අඛණ්ඩව පහත වැටී තිබුණි. ඒ අනුව එම අංශයේ මෙහෙයුම් අකාර්යක්ෂමතාවය පිලිබඳ විශ්ලේෂණයක් සිදු කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කර නොතිබුණි. | පෞද්ගලික අංශය මගින් ඉදි කරන නල ළිදක් සඳහා වැය වන මුදලට වඩා වැඩි මුදලක් මණ්ඩලය මගින් නල ළිදක් ඉදි කිරීමේදී වැය වීම හේතුවෙන් නල ළිං ඇණවුම් මණ්ඩලයට ලැබීම ඉතාමත් අඩු වීම, ඉදි කිරිමට අපහසු හා පාරිසරික හා මහජන ගැටළු ඇති ස්ථාන වලද වාණිජ පරමාර්ථ වෙනුවෙන් නල ළිං ඉදි කර ගත යුතු පාර්ශව වෙතින් පමණක් මණ්ඩලයට නල ළිං ඉදි කිරිම සඳහා ඇණවුම් ලැබීම, කොවිඩ් වසංගත හා අනෙකුත් හේතු මත රාජ්‍ය ව්‍යාපෘති නතර වීම , නීත්‍යානුකූල නොවන ආකාරයට නල ළිං ඉදිකිරීම් සිදු කරන ආයතන වලට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරිමට බාධාවක් පැවතීම යන කරුණු හේතුවෙන් මණ්ඩලය වෙත ලැබෙන නල ළිං ප්‍රමාණය අඩු වී ඇත. | විදුම් අංශයට ඇණවුම් ලබා ගැනීමට වැඩපිළිවෙලක් මෙන්ම පිරිවැය පිළිබඳ නැවත ඇගයීමක් කල යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්ව අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජල සම්පත් මණ්ඩලය 1978 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබූ කොළඹ 07 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු.12,772,000 ක බදු මුදලක් ගෙවා වාර්ෂික බදු බලපත්‍රයක් ලබා ගන්නා ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම්වරයා මණ්ඩලය වෙත දැනුම් දී තිබුණද ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. පසුව ඉඩමේ භුක්තිය පිළිබඳව සමතයකට පත්වන ලෙස නීතිපතිවරයා විසින් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් වෙත උපදෙස් ලබා දී තිබියදී නීතිපතිවරයාගේ උපදෙස් පරිදි කටයුතු නොකර අවුරුදු 45 ක් පමණ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය පරිශ්‍රය එවකට අග්‍රාමාත්‍යවරයා භාවිතා කළ නිළ නිවස පුළුල් කිරීමේ කාර්ය සඳහා යොදා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියකින්ද තොරව භාරදී තිබුණි. ප්‍රධාන කාර්යාලය 2021 ජුලි 18 දින සිට 2022 ජුලි 15 දක්වා රාජගිරිය ප්‍රදේශයේ පෞද්ගලික කුලී ගොඩනැගිල්ලකද, 2022 අගොස්තු 01 දින සිට නාවල කොස්වත්ත ප්‍රදේශයේ පෞද්ගලික ගොඩනැගිල්ලකද පවත්වා ගෙන ගොස් තිබුණි. ඒ සඳහා 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගොඩනැගිලි කුලී ලෙස රු.30,511,722 ක් ගෙවා තිබුණි. | කොළඹ 07 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ අංක 2 ඒ දරණ ස්ථානයේ ජල සම්පත් මණ්ඩලය පිහිටුවා තිබූ අතර මණ්ඩලය වාණිජ්‍ය නොවන ආයතනයක් බැවින් 2001, 2002,2014 සහ 2017 ලිපි මඟින් එවකට සභාපතිවරුන් මෙම ඉඩම ප්‍රදානයක් හෝ දීර්ගකාලීන බදු පදනම මත ලබා දෙන ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් සහ බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉල්ලීම් ඉදිරිපත් කල ද එම ඉල්ලීම් වලට නිසි පිළිතුරක් නොලැබීම නිසා 2017 වන තෙක් බදු ගෙවීම පිළිබඳ එකඟත්වයක් නොතිබිණි. එසේ තිබියදී තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් 2016.07.05 දින ලිපියක් මඟින් 2013 සිට 2016 දක්වා හිඟ මුදලවූ රු. 43,637,666 ක් හා 2017.12.14 දින ලිපියකින් හිඟ මුදල රු. 56,409,666 ක් ගෙවන ලෙස දන්වා තිබිණි. ජල සම්පත් මණ්ඩලය වාණිජ ආයතනයක් නොවන හෙයින් එම මුදල ගෙවීමට හැකියාවක් නොමැති බව සභාපතිවරුන් විසින් ප්‍රාදේශීය ලේකම්ට දැනුම් දී තිබිණි. 2016.12.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් මෙම ඉඩම කොළඹ නාගරික සැලැස්ම අනුව දීමනාවකින් තොරව නාගරික සංවර්ධන අධිකාරියට පවරාගෙන ජල සම්පත් මණ්ඩලයට බත්තරමුල්ල, හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පර් 40 ක ඉඩමක් වාර්ෂික බදු පදනම මත ලබා දෙන ලදී.<br>ජල සම්පත් මණ්ඩලයට අදාල පරිශ්‍රයෙන් ඉවත්වීමට සිදුවූයේ කොළඹ 07 , විජේරාම මාවතේ අංක 117 පිහිටි හිටපු ජනාධිපති මෙන්ම එවකට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ නිළ නිවස පුළුල් කිරීම සඳහා ඉඩමෙන් කොටසක් පවරා ගැනීම නිසාය.නෙදර්ලන්ත රජයේ ණය ආධාර යටතේ බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් පර්. 40 ක ඉඩමේ ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සහ දත්ත මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු. මිලියන 200ක් ලබා | නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම සඳහා විධිමත් බදු ගිවිසුමක් අත්සන් කර මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය එහි ඉදිකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | දීමට නියමිතව තිබුනද නාගරික සංවර්ධන අධිකාරිය ගිවිසුම අත්සන් කිරීම දිගින් දිගටම කල් දැමීම නිසා මේ දක්වා කුලී ගොඩනැගිල්ලක ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාමට සිදුව ඇත. | |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරවීමේ පාර්ශවය ( Implementing Partner) ලෙස කටයුතු කරන ලද ව්‍යාපෘති 2 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් රු.7,850,000 ක ප්‍රතිපාදන වෙන් කර රු.802,000 ක් පමණක් වියදම් කර තිබුණි.ඒ අනුව අදාළ ව්‍යාපෘති සඳහා වාර්ෂික අයවැය මඟින් වෙන් කරන ප්‍රතිපාදන වලින් සියටට 89 ක් වර්ෂය තුළ භාවිතා නොකිරීම මත ඌණ උපයෝජිතව තිබුණි. | 2023 වර්ෂය සඳහා අදාල ක්ෂේත්‍ර කටයුතු කරගෙන යාමේදී අවසාන කාර්තුවේ පැවති අධික වර්ෂා කාලගුණ තත්වය හේතුවෙන් සැළසුම් කල පරිදි ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම දුෂ්කර විය.මෙම කටයුතු විධිමත්ව 2024 වර්ෂයේදී සිදු කිරීමට සැළසුම් කර තිබේ. | අයවැය මගින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන සැලසුම් ප්‍රකාරව කාර්යක්ෂම හා ඵලදායී ලෙස උපයෝජනය කල යුතුය. |